ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/S/19/05/23

# මාධ්‍ය නිවේදනය

"සිවිල් වැසියන් විසින් කරනු ලබන උද්ඝෝෂණ සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී රාජ්‍ය සහ නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටීන් පිළිබඳ නිර්දේශිත මාර්ගෝපදේශන" ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023 මැයි මස 12 වන දින එළිදක්වන ලදී. මෙම නිර්දේශිත මාර්ගෝපදේශන වසරක පමණ කාලයක් ගත කරමින් සිවිල් සංවිධාන ක්‍රියාධරයින්, නීති විශාරදයින්, නීතිය බලාත්මක කරනු ලබන නිලධාරීන්ගේ අදහස් ද විමසමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද්දකි.

2023 මැයි මස 19 වන දින මෙම මාර්ගොපදේශන පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සියළු ප්‍රාදේශීය කාර්යාල සහ උප කාර්යාලවල සම්බන්ධීකරණ නිලධාරීන් මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්කර දැනුවත් කිරීම සිදුකරන ලදී. මෙහි අරමුණ වූයේ මෙම නිර්දේශිත මාර්ගෝපදේශන ඒ ඒ ප්‍රාදේශිය කාර්යාල මට්ටමින් සිවිල් සංවිධාන නියෝජිතයින්, මානව හිමිකම් ක්‍රියාධරයින්, ජනමාධ්‍යවේදීන් සහ නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනවල නියෝජිතයින් වෙත මෙම නිර්දේශිත මාර්ගෝපදේශය යොමුකර අදහස් ලබාගෙන උක්ත මාර්ගෝපදේශ අවසන් මාර්ගෝපදේශ බවට පත්කරගැනීම වේ. මෙහිදී සබරගමුව පළාත ආවරණය කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාලයක් නොමැති බැවින් එම අදහස් විමසීම ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකිරීමට තීරණය විය. මෙම කටයුතු ඉතාමත් කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය බවත් ඒ සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදී කටයුතු කරන ලෙසත් සභාපතිතුමිය මෙහිදී ප්‍රාදේශීය නිලධාරීන් වෙත දන්වන ලදී. මෙම අවස්ථාවට කොමිෂන් සභාවේ ලේකම්තුමා සහ අධ්‍යක්ෂවරුන් ද සම්බන්ධ විය.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.05.19